# විවිධ දැන්වීම්

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වගන්තිය අනුව වයඹ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් 2010.07.16 දිනැති අංක 1663 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසේ පළකර ඇති පහත උපලේඛන අංක 01 හි සඳහන් අතුරු ව්‍යවස්ථා 06, 2010.09.30 කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මහ සභාවේ, යෝජනා අංක 4-11 යටතේ වැළඳ ගැනීමට තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තව ද එකී අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ පහත 2 උපලේඛනයේ සඳහන් පරිදි 2011.01.01 දින සිට ගාස්තු අයකිරීමටත්, 2010.12.24 වැනි දින පවත්වන ලද මහ සභාවේ යෝජනා අංක 4-1 යටතේ තීරණය කර ඇති බවද මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. එම්. ජේ. ප්‍රනාන්දු,
බලයලත් නිලධාරි - කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2011 මාර්තු මස 01 වැනි දින,

*උපලේඛන අංක 01*

01. අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න සහ අන්තරාදායක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
02. සංචාරක වෙළඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව
03. ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම
04. ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
05. ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
06. ලැගුම් නිවාස හා නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.

*උපලේඛන අංක 02*

වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම

| | | *එක් වරක් පමණක් ගෙවන වාර්ෂික ලියාපදිංචි ගාස්තුව රු. ශත* | *නවතා තැබීමේ ගාස්තුව (වාර්ෂික) රු. ශත* |
|---|---|---|---|
| 01. | කුලී ත්‍රීරෝද රථ සඳහා | 100 | 500 |
| 02. | මගී ප්‍රවාහන බස්රථ නොවන - කුලී වෑන් රථ | 100 | 600 |

04-202